# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක - 2261/4 ජනවාරි මස 03 වැනි සඳුදා - 2022.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

### වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ නිවේදන

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (2) වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව වයඹ පළාත් ආණ්ඩුකාරවර වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2232/2 හා 2021.06.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පත් කරන ලද අධිකරණ නිලධාරී විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුගේ වාර්තාවට අනුව වාරියපොල ප්‍රාදේශීය සභාවේ සභාපති දිසානායක මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර දිසානායක මහතා ඉහත කී *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් සියලු චෝදනාවලට වැරදිකරු වන බව තහවුරු වන බැවින්, වයඹ පළාත් ආණ්ඩුකාරවර අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ දෙවැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 185 (1) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, වාරියපොල ප්‍රාදේශීය සභාවේ සභාපති දිසානායක මුදියන්සේලාගේ තිලකරත්න බණ්ඩාර දිසානායක මහතා 2022.01.01 දින සිට සභාපති ධූරයෙන් ඉවත් කරනු ලබන බවට මෙයින් නියම කරමි.

අද්මිරාල් ඔෆ් ද ෆ්ලීට් වසන්ත කරන්නාගොඩ,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2021 දෙසැම්බර් මස 31 වැනි දින,
කුරුණෑගල ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

EOG 01-0001

1A - PG 5681 — 12 (2022/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.